මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

පුරවැසි අධ්‍යාපනය	6 ශ්‍රේණිය	කාලය : පැය 02 යි

ශිෂ්‍යයාගේ නම :- .....

I පත්‍රය

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. පාසල් සංවිධාන ..... යනු පාසලේ පරිපාලන හා සංවර්ධන කටයුතු සකස් වී ඇති ආකාරයයි.
2. අප රටේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය ..... කොට්ඨාශයයි.
3. මහනගර සභාවක ප්‍රධානියා .....ය.
4. ප්‍රදේශ වාසින්ගේ ..... පවුලේ මෙන්ම ප්‍රදේශයේ ද දියුණුවට හේතුවේ .
5. පාසලේ ඉතිහාසය සෙවීමට ..... උපයෝගි කරගත හැකිය.

(නගරාධිපති, සාමූහිකත්වය, ව්‍යුහය, ලොග් පොත, ග්‍රාම නිළධාරි , උප්පැන්න සහතිකය)

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

6. ගුරු ඇගයීම් කටයුතු කිරීම විදුහල්පතිගේ කාර්යයකි. (.....)
7. සෑම පුරවැසියෙකුටම අනන්‍යතාවයක් නැත. (.....)
8. ඔබගේ දක්ෂතා සමාජයේ දියුණුවට වැදගත් නොවේ . (.....)
9. පාසල අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු මෙහෙවර ප්‍රකාශයෙන් දැක් වේ. (.....)
10. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 22ක් ඇත. (.....)

- අංක 11 සිට 15 දක්වා ප්‍රකාශවලට ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

ඒ කොටස	බී කොටස
11. ආර්ථික කටයුත්තකි.	රට සංවර්ධනය කිරීම
12. මානව සම්පත පුහුණුවෙන්	භූමිය
13. පංශු සංරක්ෂණ ක්‍රමයකි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
14. නිවාස ඉදි කිරීමට අවශ්‍ය වේ.	වෙළඳාම
15. රාජ්‍ය ආයතනයකි	වැටි බැඳීම

LIVEWORKSHEETS

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. ක්‍රි. ව. 1931 දී ලංකාවේ මුල්ම අධ්‍යාපන අමාත්‍යවරයා වූයේ,

    1. ඩී. එස්. සේනානායක මහතා ය. 2. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ය.

    3. ජේ. ආර්. ජයවර්ධන මහතා ය. 4. ඒ. ඊ. ගුණසිංහ මහතා ය.

17. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් ඒකතු වීමෙන් සෑදෙන්නේ,

    1. ගමකි. 2. පළාතකි. 3. දිස්ත්‍රික්කයකි. 4. නගරයකි.

18. උප්පැන්න සහතිකයක් නිකුත් කරනු ලබන්නේ,

    1. රෝහලෙනි. 2 තැපල් කාර්යාලයෙනි. 3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනි. 4. පාසලෙනි.

19. බෝවන රෝග පාලනය හා සිසුන්ගේ සෞඛ්‍යය පරීක්ෂාව සඳහා අපට සහාය වන්නේ,

    1. විදුහල්පති ය. 2. පොලිස් නිළධාරියා ය. 3. වෛද්‍යවරයා ය. 4. මහජන සෞඛ්‍ය පරීක්ෂවරයා ය.

20. හම්බන්තොට දිස්ත්‍රික්කය අයත් පළාත කුමක්ද?

    1. ඌව පළාත 2. බස්නාහිර පළාත 3. දකුණු පළාත 4. උතුරු පළාත

(ල-2 බැගින් 20=40)

LIVEWORKSHEETS